**වේයන්ගොඩ ගුවන් පාලම ඉදිකිරීම ව්‍යාපෘතිය - 2013**

--------------------------------------------------------------

වේයන්ගොඩ ගුවන් පාලම ඉදිකිරීම ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යාවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) සහ ස්පාඤ්ඤයේ බැන්කෝ බිල්බාඕ විශ්කයා ආර්ජන්ටේරියා, එස් ඒ.( Bank of Banco Bilbao Vizcaya Argentaria) අතර 2012 මාර්තු 13 දින එලඹි අංක 201 2015/ එස්එල් දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය, හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයොජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ වේයන්ගොඩ ගුවන් පාලම සැලසුම් කිරීම , සැපයීම හා ඉදිකිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,433 ක් වන අතර ඉන් යූරෝ මිලියන 11.2 කට සමාන රු.මිලියන 1,883 ක් ණය ගිවිසුම යටතේ මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණු අතර, ඉතිරි රු.මිලියන 550 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වි තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ඔක්තෝබර් 23 දින ආරම්භ කර 2013 දෙසැම්බර් 22 වනවිට නිමකිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබූ අතර 2013 නොවැම්බර් 08 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාරගන්නා ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

--------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දැ

තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.1,675,174,940 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,949,049,789 ක් විය.සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ගුවන් පාලමේ පිරිවැය | 1,649,938,124 | 268,764,065 | 1,918,702,189 |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 23,479,468 | 5,110,784 | 28,590,252 |
| ජංගම නොවන වත්කම් | 1,757,348 | - | 1,757,348 |
| | 1,675,174,940 | 273,874,849 | 1,949,049,789 |

## 5. විගණන නිරීක්ෂණ

එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය නම් වූ වෙනත් ව්‍යාපෘතියකට අදාළ කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද එකතුව රු.16,575,493 ක් වූ පිරිවැය ව්‍යාපෘතියේ පිරිවැය ලෙස සලකා ඒ අනුව ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| ඔරුගොඩවත්ත අංගණයක් ඉදිකිරීම | 2,142,843 |
| කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | 10,417,177 |
| සම්බන්ධීකරණ නිලධාරියකුට වැටුප් හා දීමනා | 472,500 |
| කාර්යාල කුලී | 3,542,973 |
| එකතුව | 16,575,493 |

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යනය, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපෘතියේ අයවැයගත ප්‍රතිපාදන හා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද ප්‍රතිපාදන | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ස්පාඤ්ඤය | 11.22 | 1,883 | - | 1,366 | 1,883 |
| ශ්‍රී ලං ර | - | 550 | 200 | 60 | 63 |
| එකතුව | 11.22 | 2,433 | 200 | *1,426 | 1,946 |

* වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

## 6.2 නිශ්ඵල වියදම්

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යාලය 2013 අප්‍රේල් මාසයේ සිට නව පරිශ්‍රයකට මාරු කර තිබුණි. කෙසේ වුවද පරණ ගොඩනැඟිල්ල සඳහා රු.535,495 ක් වූ කුලිය 2013 මාර්තු මාසය සඳහා අතිරේකව ගෙවා තිබුණි. තවද පරණ ගොඩනැඟිල්ලේ පිරිසිදු කිරීම් ගාස්තු සඳහා 2013 අප්‍රේල් සිට ජුලි දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.66,000 ක මුදලක්ද ගෙවා තිබුණි.

## 6.3 භෞතික කාර්ය සාධනය

ව්‍යාපෘති කටයුතු 2013 ඔක්තෝබර් 23 දින නිම කර 2013 නොවැම්බර් 08 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි.

## 6.4 ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු

ගුවන් පාලම ඉදිකිරීම සඳහා 2013 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතිය විසින් ඉඩම් කොටස් 45 ක් අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වුවද ඉඩම් අත්පත් කර ගැනිමේ පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම ඉඩම් කොටස් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි.